රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 13/2019(I)

මගේ අංකය: EST-7/UNIFO/06/V
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.06.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>රජයේ නිලධරයන්ගේ ඇඳුම</u>

1989.02.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/89ට අමතරව සියලුම රජයේ නිලධරයන්ට අදාළ වන පරිදි 2019.05.29 දිනැතිව නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2019 සංශෝධනය කරමින් ඒ වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කිරීමට 2019.06.25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. 2019.04.29 දින නිකුත් කරන ලද අංක 2121/1 සහ 2019.05.13 දින නිකුත් කරන ලද අංක 2123/4 දරන අති විශේෂ ගැසට් නිවේදනයන්හි සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කර එහි සඳහන් නියෝග ඔබ යටතේ පවතින සියලුම ආයතනයන්හි නිලධරයන් විසින් තරයේ පිළිපදින බවට වග බලාගත යුතුය.

03. රජයේ නිලධරයන්ගේ ඇඳුම් සම්බන්ධයෙන් පහත විධිවිධාන අනුගමනය කළ යුතුය.

I. රජයේ නිලධරයන් රාජකාරී වේලාව තුළ ස්වකීය කාර්යාල පරිශ්‍රයට පැමිණීමේ දී පිරිමි නිලධරයන් කලිසම හා කමිසය හෝ ජාතික ඇඳුමින් සැරසී සිටිය යුතු අතර කාන්තා නිලධාරිනියන් සාරිය, ඔසරිය හෝ රාජ්‍ය සේවයේ ගෞරවය රැකෙන සුදුසු සංවරශීලී ඇඳුමකින් සැරසී සිටිය යුතු වේ. සැමවිටම නිලධරයෙකුගේ මුහුණ (දෙකන් නොඇතුළත්ව) සම්පූර්ණයෙන් නිරාවරණව තිබිය යුතු අතර මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් පනවා ඇති විධිවිධානවලට බාධාවක් නොවන ඇඳුමක් විය යුතුය.

II. දැනටමත් නිල ඇඳුමක් හෝ නිල ඇඳුම් දීමනා ලබන නිලධරයන් තමාගේ අනුමත නිල ඇඳුමින් සැරසී රාජකාරියේ යෙදී සිටිය යුතුය.
උදා: රියදුරු, කාර්යාල කාර්ය සහායක, ග්‍රාම නිලධාරී වැනි තනතුරු දරන්නන්

III. රජයේ සේවයේ නියුතු නිලධාරිනියන් ගර්භනී සමය තුළ සේවයට පැමිණීමේ දී පහසු හා සුදුසු ඇඳුමකින් සැරසී සේවයට පැමිණිය හැකිය.

IV. කිසියම් ආගමික චාරිත්‍රයකට අනුව තම ඇඳුම සකස් කරගෙන සිටින නිලධරයන් වේ නම් ඔවුන්ට ඉහත Iහි පරිදි ඇඳුමින් සැරසීමෙන් අනතුරුව එකී ආගමික අනන්‍යතාවය තහවුරුවන ලෙස හා නිලධරයන්ට සම්පූර්ණ මුහුණ පැහැදිලිව (දෙකන් නොඇතුළත්ව) හඳුනාගත හැකිවන ලෙස අතිරේක පැළඳුමක් භාවිතා කළ හැකිය.

04. සේවාලාභියෙකු ලෙස රජයට අයත් පරිශ්‍රයකට ඇතුළු වීමේදී හෝ රජය මගින් දෙනු ලබන සේවාවන් ලබාගැනීමට පැමිණීමේදී සෑම තැනැත්තෙකුම තමන් පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයේ ඇඳුමකින් සැරසී පැමිණිය යුතු බවට විධිවිධාන පැනවීමට සියලුම ආයතන ප්‍රධානීන් වගබලාගත යුතුය.

05. 1989.02.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/89 තවදුරටත් වලංගු වේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය